ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020
# General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

ගෘහ ආර්ථික විද්‍යාව I
Home Economics I

28 S I

කාලය : පැය දෙකයි
Time : Two hours

**උපදෙස් : සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. නිර්මාණකරණයේ උපයෝගිතා සාධකයක් නොවන්නේ
   I. අනුකූලත්වය
   II. කලාත්මක බව
   III. සංකල්පය
   IV. සැකැස්ම හා පිහිටීම
   V. ප්‍රමාණය හා සමානුපාතික බව

2. පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය තෝරන්න
   I. වර්ණ චක්‍රය සෑදී ඇත්තේ වර්ණ නාමයෙන් හැඳින්වෙන වර්ණ වලිනි.
   II. වර්ණ චක්‍රයට අයත් නොවන සුදු,කළු,හා ඇපල් වයිට් යන වර්ණ උදාසීන වර්ණ වේ.
   III. වර්ණයක දීප්තිමත් බව හෝ අඳුරු බව තීව්‍රතාවය යි.
   IV. එකම ලක්ෂණ නැවත නැවත පෙන්නුම් කිරීම අසාත්මක රිද්මය යි.
   V. නොසන්සුන්බව, කලබලකාරීබව, විකර්ණකාර රේඛා මගින් ඇති කරන හැඟීමකි.

3. යම් සැකැස්මක් තුළ නිශ්චිත තෝරාගත් උපාංගයක් හෝ කිහිපයක් අනෙක් උපාංගයන්ගේ සහයෝගය සහිතව වඩාත් ඉස්මතුවන ආකාරයට පෙන්වීම.
   I. සමෝධානයයි
   II. ඒකමතික බවයි
   III. අවධාරණයයි
   IV. සමානුපාතික බවයි.
   V. සංකල්පයයි

4. අභ්‍යන්තර අවකාශයේදි කෘතිම ආලෝකය ලබා දීමේදි එම ආලෝකයේ ප්‍රමාණාත්මක හෙවත් ආලෝකයේ තීව්‍රතාවය මනිනු ලබන ඒකකය

   I.ලක්ස් (Lux)
   II. විදුලි ජවය (Power )
   III. ධාරාව ( Current )
   IV. වොට් (w)
   V. ප්‍රතිරෝධය

5. කාබෝහයිඩ්‍රේට් සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය වන්නේ
   I. ග්ලූකෝස් අණු විශාල සංඛ්‍යාවක් එකිනෙක සම්බන්ධ වීමෙන් පොලිසැකරයිඩ් සෑදේ.
   II. මොනසැකරයිඩ් අණු දෙකක් සම්බන්ධ වීමෙන් ඩයිසැකරයිඩ අණුවක් සෑදේ.
   III. උක් හා බීට් යුෂයේ සුක්‍රෝස් බහුලව අඩංගු වේ.
   IV. ශාකවල සෛල බිත්ති සෙලියුලෝස්වලින් සෑදී ඇත.
   V. මොනසැකරයිඩ්වල අනුක සූත්‍රය $C_6 H_{12} O_6$ වන අතර ව්‍යුහ සූත්‍රයද එකිනෙකට වෙනස් නොවේ.

6. ශරීරයට අවශ්‍ය ප්‍රමාණයට වඩා, ආහාර මඟින් ලබා ගන්නා ග්ලූකෝස් අක්මාවේ හා පේශි තුළ තැන්පත් වන්නේ

I. ග්ලයිකෝජන් ලෙසය
II. සෙලියුලෝස් ලෙසය
III. ග්ලැක්ටොස් ලෙසය
IV. ලැක්ටෝස් ලෙසය
V. මෝල්ටෝස ලෙසය

7. ඇමයිනෝ අම්ල දෙකක් එකට සම්බන්ධ වී සංයුක්ත අණුවක් සෑදීමේදී එක් අමයිනෝ අම්ලයක කාබොක්සිල් කාණ්ඩය හා අනෙක් ඇමයිනෝ අම්ලයේ ඇමයිනෝ කාණ්ඩය අතර ඇතිවන බන්ධනය

I. පොලිපෙප්ටයිඩ බන්ධනය වේ.
II. ට්‍රයි පෙප්ටයිඩ බන්ධනය වේ.
III. පෙප්ටයිඩ බන්ධනය වේ.
IV. ඩයි පෙප්ටයිඩ බන්ධනය වේ.
V. ට්‍රයි හා පොලිපෙප්ටයිඩ බන්ධනය වේ.

8. පැරා ඇමයිනෝබෙන්සොයික් අම්ලය ලෙස හඳුන්වන්නේ

I. විටමින් $B_{11}$ ය
II. විටමින් $B_{10}$ ය
III. විටමින් $B_8$ ය
IV. විටමින් $B_9$ ය
V. විටමින් $B_5$ ය

9. ආහාර හා ආශ්වාස වාතය ගමන් කිරීමට පොදු මාර්ගයක් වන අතර අපිජිහ්විකාව ඇරීම හා වැසීම මඟින් ආහාර අදාළ මාර්ගය වෙත යොමු කරනු ලබන්නේ.

I. අග්න්‍යාශය මඟිනි
II. ග්‍රහණිය මඟිනි
III. අන්නස්‍රෝතය මඟිනි
IV. මුඛය මඟිනි
V. ග්‍රසනිකාව මඟිනි

10. යකඩ හිඟ වීම නිසා ඇතිවිය හැකි ඌනතා ලක්ෂණයක් නොවන්නේ

I. අධික ලෙස විඩාවට පත්වීම
II. අවධානය හා මතක තබා ගැනිමේ ශක්තිය අඩුවීම
III. ඇස්වල වියළි භාවය ඇති වීම
IV. ශරීර වර්ධනය අඩුවීම
V. අඩු උපත් බරක් සහිත දරුවන් බිහි කිරීම

11. පෝෂණ ගැටලු හා දුෂ්පෝෂණය වැළැක්වීම සඳහා සම්බන්ධ වන ආයතන අතරින් සිවිල් සංවිධානයක් වන්නේ

I. වර්ල්ඩ් විෂන් (World Vision)
II. අධ්‍යාපන අමාත්‍යාංශය
III. යුනිසෙෆ් සංවිධානය ( Unicef)
IV. පෝෂණවේදීන්ගේ සංගමය
V. වෛද්‍ය පර්යේෂණ ආයතනය

12. ආහාර හා බෝ නොවන රෝග සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
    A. හෙලිකොබැක්ටර්පයිලොරි (Helicobactorpylori) යන බැක්ටීරියාව නිසා ද ආමාශයේ ශ්ලේෂ්මල පටලයට හානි සිදුවීමෙන් ආමාශයික ප්‍රදාහය ඇති විය හැක.
    B. පොටැසියම් බහුල ආහාර අඩුවෙන් ගැනීම අධික රුධිර පීඩනයට එක් හේතුවකි.
    C. දෙපාවල සංවේදීතාවය අඩුවීම ස්ථූලතාවයේ එක් රෝගී ලක්ෂණකි.
    D. මුහුනු පරික්ෂා කළවිට කට ඇද වී ඇති බව පෙනීම දියවැඩියා රෝගියෙකු පෙන්නුම් කරන රෝග ලක්ෂණයකි.

    මෙයින් සාවද්‍ය ප්‍රකාශ වන්නේ

    I. A හා D ය
    II. A හා B ය
    III. B හා C ය
    IV. C හා D ය
    V. B හා D ය

13. ආකලන.ද්‍රව්‍ය අතුරින් මෘදු කාරක සනයට අයත් වන්නේ
    I. පොල්, පොල් කිරි, කබලේ බැදගත් පොල්, බීට් හා අල වර්ග
    II. විනාකිරි, ලුනු, සීනි
    III. සැකරින්, මොනොසෝඩියම් ග්ලුටමේට්
    IV. විනාකිරි, දෙහි, සියඹලා, බිලිං,ගොරකා ඇඹරුල්ලා
    V. පැපොල්, පෙරුම්කායම්,මුදවපු කිරි, විනාකිරි, දෙහි ඇඹුල්, සියඹලා, ගොරකා

14. සුක්‍රෝස්, ආම්ලික හෝ විජලන තත්ත්ව ඇති විට ඉහළ උෂ්ණත්වය හමුවේ ප්‍රතික්‍රියා මාලාවකට ලක් වී තද දුඹුරු පැහැ වීම
    I. මෙලාඩ් ප්‍රතික්‍රියාවයි
    II. කැරමළීකරණයයි
    III. දුඹුරු වීමේ ප්‍රතික්‍රියාවයි
    IV. එන්සයිමීය දුඹුරු වීමයි
    V. එන්සයිමීය නොවන දුඹුරු වීමයි

15. විවධ ප්‍රතික්‍රියා නිසා තෙල් හා මේද සහිත ආහාර රසායනිකව පරිහානියට පත්වී අප්‍රසන්න රසයක් හා ගන්ධයක් ඇතිවීම මේද මුඩු වීමයි.මෙලෙස මුඩු වීමේ ක්‍රියාවලිය වේගවත් කරන සාධකයක් නොවන්නේ
    I. උෂ්ණත්වය
    II. කාලය
    III. ජලය
    IV. ආලෝකය
    V. ස්වයං ඔක්සිකරණය

16. උපකරණය භ්‍රමණය වන විට උපකරණය තුළින් හුමාලය ගමන්කර ආහාරයේ ජලය ඉවත් වී වියළි සන තත්ත්වොයට පත් වීම
    I. විසිරි වියළනය යි
    II. බෙර වියළනය යි
    III. කැබිනට්ටු වියළනය යි
    IV. රික්තක වියළනය යි

V. උමං වියළනය යි

17. විවිධ ඇසුරුම් ද්‍රව්‍ය ඒකාබද්ධ කර ඇති ටෙට්‍රා පැක් ඇසුරුමේ ඔක්සිජන් වායුවට හා ආලෝකයට ප්‍රතිරෝධී පටලයක් ලෙස ක්‍රියා කරන ස්තරය වන්නේ

I. අභ්‍යන්තර පොලිතීන් පටලය
II. ඇලුමිනියම් පටලය
III. කඩදාසි ස්තරය
IV. බාහිර පොලිතින් පටලය
V. ඉහත කී සියල්ලම

18. යෝගට් හා වෙනත් කිරි නිෂ්පාදනවල අඩංගු ජෛව ක්‍රියාකාරි සංඝටක වන්නේ

I. ප්‍රී බයෝටික් හා ස්ටෙරෝල්
II. ෆිනෝලික සංයෝග හා විටමින්
III. ඇමයිනෝ අම්ල හා මේද අම්ල
IV. ප්‍රී බයෝටික් හා ප්‍රෝ බයෝටික්
V. ප්‍රතිඔක්සිකාරක හා ප්‍රී බයෝටික්

19. පාංශු වසුන් ලෙස ප්‍රයෝජනයට ගත හැකි ඖෂධ ශාක කාණ්ඩය වන්නේ

I. ගොටුකොළ, මුගුණුවැන්න
II. උඳුපියළිය, තිප්පිලි
III. පාවට්ටා, කොහොඹ
IV. කොහොඹ, ගම්මාලු
V. කහ, කෝමාරිකා

20. ආහාර පරිරක්ෂණය කිරීම සඳහා විවිධ ආහාරවලට යොදා ගන්නා පොදු රසායනික සංයෝග සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. කිරි ආශ්‍රිත නිෂ්පාදන රසකැවිලි සඳහා යෝගට් යොදා ගනී.
B. මස් හා චීස් නිෂ්පාදන සඳහා ප්‍රෝපියෝනෙට් යොදා ගනී.
C. පළතුරු පල්ප, වියළන ලද එළවළුවලට යොදන සල්ෆයිඩ උපරිම විෂ තතත්වයක් පෙන්වයි.
D. කෙසෙල්වල මතුපිට යෙදවීම සඳහා බෙන්සොඒට් භාවිතා කරයි.

මින් නිවැරදි ප්‍රකාශය වන්නේ

I. A හා B ය
II. B හා C ය
III. A හා C ය
IV. C හා D ය
V. B හා D ය

21. මේදය භාවිතයෙන් කෑම පිසගැනීමේදී තාප සංක්‍රමණය වනුයේ

I. සංවහනය මගින්
II. විකිරණය මගින්
III. සන්නයනය මගින්
IV. විකිරණය හා සංවහනය මගින්
V. සන්නයනය හා සංවහනය මගින්

22. අමුරෙදි පෙර පිරියම් කිරීමේ ක්‍රියාපිළිවෙළ වනුයේ

I. විරංජනය, කැඳහරණය, මලහරණය, කෙඳි පිළිස්සීම
II. කෙඳි පිළිස්සීම, කැඳහරණය, මලහරණය, විරංජනය
III. කැඳහරණය, විරංජනය, කෙඳි පිළිස්සීම, මලහරණය

IV. විරංජනය, කෙඳි පිළිස්සීම, මලහරණය, කැඳහරණය
V මලහරණය, විරංජනය,කෙඳි පිළිස්සීම, කැඳහරණය

23. නිමි ඇඳුම් නිෂ්පාදනයේදී ඇඟලුම් කර්මාන්ත ශාලාවක් තුළදී සිදු නොවන ක්‍රියාවලිය වන්නේ
I. නිමි ඇඳුම්වල තත්ව පරීක්ෂාව II. පිරිසැලසුම් සැකසීම
III. මෝස්තර නිර්මාණය IV. ඇසුරුම් කරණය
V. මාකර් සටහන් තැබීම

24. ශ්‍රී ලංකාවේ ප්‍රථමවරට නිමිඇඳුම් අපනයනය සිදුකරන ලද්දේ
I. 1960 II. 1947 III. 1956 IV. 1970 V. 1946

25. නිමි ඇඳුම් කර්මාන්තයේදී ලේස් හා ඉලාස්ටික් ඇල්ලීමට යොදාගන්නා මැහුම් වර්ගය වන්නේ
I. අඟුලු මැස්ම II. අත්මැස්ම III. නොපෙනන මැස්ම
IV. දම්වැල් මැස්ම V. තනිනූලේ දම්වැල් මැස්ම

26. කෙටි සාය පතරොම සඳහා වාටියට තබනු ලබන මැහුම්වාසි වන්නේ
I. 2 cm II. 2.5 cm III. 1.5 cm IV. 4 cm V. 3 cm

27. පහත දක්වා ඇති කෙඳි අතරින් පුනර්ජනිත කෙඳි වර්ගය කුමක්ද?
I. රෙයෝන් II. ලෝම III. වීදුරු
IV. ඕර්ලෝන් V. ඇස්බැස්ටෝස්

28. වියන ලද රෙද්දක් මතුපිට නූල්වලින් නැගුණු විකර්ණ රේඛා දක්නට ලැබේ නම එම වියමන
I. ජටා වියමන II. වාම් වියමන III. දික්දාර වියමන
IV. හීරි වියමන V. හරස්දාර වියමන

29. නැනෝ තාක්ෂණය උපයෝගී කරගනිමින් රෙදි මත රිදී ආලේපයක් ඇතිකිරීම
I. සුවපහසු නිමාව II. සැන්ෆ්‍රයිස් කිරීම
III. බැක්ටීරියා නාශක නිමාව IV. ජලරෝධක නිමාව
V. විරංජනය කිරීම

30. අමුරෙදි මසරීකරණය සඳහා යොදා ගන්නා රසායන ද්‍රව්‍යය වන්නේ
I. උණුසුම් ජලය II. සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ්
III. සල්ෆියුරික් අම්ලය IV. සෝඩියම් ක්ලෝරයිඩ්
V. සෝඩියම් හයිපොක්ලෝරයිඩ්

31. විධිමත් සංවාදයක් ඇරඹීම සඳහා ආචාර කිරීමේදී සැළකිල්ලට ගත යුත්තේ
I. රැකියාවේ තනතුරයි II. ආගම හා සංස්කෘතිය
III. දේශපාලන වටපිටාව IV. ස්ත්‍රී පුරුෂ භාවයයි
V. අධ්‍යාපන මට්ටමයි

32. අපේක්ෂිත ප්‍රතිඵලය පුද්ගල සම්බන්ධතාවලට හානි නොවන සේ ළඟාකර ගැනීම හැඳින්විය හැක්කේ

I. ආචාර ධර්ම II. අන්තර් පුද්ගල සම්බන්ධතා III. ආචාර ධර්ම
IV. නිවැරදි සන්නිවේදනය V. සංසදි කථිකාව

33. ප්‍රතිමෝදක ක්‍රියාකාරකම් පිළිබද අසත්‍ය ප්‍රකාශය වන්නේ
I. පුද්ගලයා හුදකලා බවින් මුදවා ගනියි.
II. කායික පීඩාව සමනය කරයි.
III. බොහෝවිට නිවසේදී සිදු කරයි
IV. මානසික පීඩාව සමනය කරයි
V. ප්‍රීතිය හා බිය ගෙන දේ

34. සංචාරකයින් අතර ජනප්‍රිය ස්වභාවික වරායක් පිහිටි ස්ථානය වනුයේ
I. ත්‍රිකුණාමලය II. හම්බන්තොට III. ගාල්ල
IV. බේරුවල V. කොළඹ

35. ශ්‍රී ලාංකිකයෙක් ජපානයේ සංචාරය කිරීම හදුන්වන්නේ කෙසේද?
I. ජාතික සංචරණය II. කලාප අභ්‍යන්තර සංචරණය
III. අභ්‍යන්තර යොමුගත සංචරණය IV. බාහිර යොමුගත සංචරණය
V. කාලාන්තර සංචරණය

36. සංචරණය මගින් සමාජයට ලැබෙන ප්‍රතිලාභයක් වන්නේ,
I. ඍජු හා වක්‍ර රැකියා අවස්ථා උදාවීම
II. නව අත්දැකීම්, මතකයන් දියුණුවීම
III. සන්නිවේදන නිපුණතා දියුණුවීම
IV. ස්ව අභිමානය හා ධනාත්මක සංකල්ප වර්ධනය වීම
V. පූර්ණ හා අර්ථවත් ජීවිතයකට දායකවීම

37. ජලයේ යෝග්‍යතාවය බැලීම සඳහා සිදුකරන භෞතික පරීක්ෂණයක් වන්නේ,
I. PH අගය මැනීම II. කෘෂි රසායන අඩංගු ප්‍රමාණ ගණනය කිරීම
III. ජලයේ අඩංගු ජීවීන් පිළිබඳ පරීක්ෂණය IV. ජලයේ උෂ්ණත්වය බැලීම
V. කාබනික, අකාබනික ද්‍රව්‍ය පරීක්ෂණය

38. ජල ඒකකයක් යනු,
I. ජලය $100\ l$ කි II. ජලය $1000\ l$ කි III. ජලය $10000\ l$ කි
IV. ජලය $10\ l$ කි IV. ජලය $1500\ l$ කි

39. වෝල්ටීයතාවය මැනීමට භාවිතා කරන ඒකකය වන්නේ,
I. ඇම්පියර් ( $A$ ) II. ඕම් ( $\Omega$ ) III. වොට් ( W)
IV. වෝල්ට් ( V ) V. කිලෝ වොට් පැය (KWH)

40. විදුලි උපකරණයක බාහිර ලෝහ ආවරණයට හෝ පොළොවට විදුලි කාන්දුවක් සිදුවන විට ස්විචය ස්වයංක්‍රීයව විසන්ධි වන්නේ
I. විලායකය මඟිනි IV. වෙන්කරනය මඟිනි
II. සිඟිති පරිපථ බිඳිනය මඟිනි V. අධි ධාරා පරිපථ බිඳිනය මඟිනි
III. ශේෂ ධාරා පරිපථ බිඳිනය මඟිනි

41. පේනුවලට රැහැන් සම්බන්ධ කිරීමේදී සජීවී රැහැනේ සම්මත වර්ණය වන්නේ,
I. කොළ II. දුඹුරු III. නිල් IV. කහ V. අළු

42. පුනර්ජනනීය ශක්ති ප්‍රභේදයක් නොවන්නේ,

I. සූර්යය තාපය
II. සුළඟ
III. ජෛව ස්කන්ධ
IV. සාගර තරංග
V. ගල් අඟුරු

43. හරිතාගාර වායු අවම කිරීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් නොවන්නේ,

I. කසළ අවම කිරීම
II. ඉන්ධන දහනය අවම කිරීම
III. දැව ඉන්ධන දහනය
IV. දියුණු පොදු ප්‍රවාහන සේවා ස්ථාපනය
V. කසළ ප්‍රතිචක්‍රීකරණය

44. ආහාර වල වඩාත් බහුල ජෛව ක්‍රියාකාරී සංඝටකයක් නොවන්නේ,

I. ප්‍රතිඔක්සිකාරක
II. ආහාරමය තන්තු
III. මේද අම්ල
IV. ෆීනෝලික සංයෝග
V. ඛනිජ ලවණ

45. යෞවන අවදියේ දැකිය හැකි මානසික ගැටලු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A - හීනමානය
B - වර්ධනය දුර්වලවීම
C - කාංසාව
D - ආතතිය

I. A හා B පමණි
II. C හා D පමණි
III. A, B හා C
IV. A, C හා D
V. B, C හා D

46. සිග්මන් ෆ්‍රොයිඩ්ට අනුව නව යොවුන්වියට අදාළ වයස්සීමාව ලෙස දක්වනුයේ.

I. අවු : 10 – 16
II. අවු : 13 – 18
III. අවු : 10 – 20
IV. අවු : 10 – 19
V. අවු : 11 – 20

47. ධනාත්මක ස්වසංකල්පයක් සහිත දරුවකු තුළ දැකිය නොහැකි ලක්ෂණය කුමක්ද?

I. තමා පිළිබඳ ඉහළ තක්සේරුව
II. අභියෝග ජයගැනීම
III. ක්‍රියාකාරීත්වය අඩුවීම
IV. ස්වයං පෙළඹවීමක් සහිත වීම
VI. ආත්ම ශක්තිය, ආත්ම අභිමානය

48. පැරණි දේශිය සහල් ප්‍රභේදයක්වන කලුහීනටි යෝග්‍යවන බෝනොවන රෝගය කුමක්ද?

I. ස්ථූලතාව
II. දියවැඩියාව
III. හෘදයාබාධ
IV. අධික රුධිර පීඩනය
V. ගැස්ට්‍රයිටීස්

49. ව්‍යාපාරයක් හා සම්බන්ධ අභ්‍යන්තර ආචාරධර්මයක් වන්නේ

I. සේවක අයිතිවාසිකම් ලබා දීමයි
II. අලෙවිකරණයයි
III. පරිසර සංරක්ෂණයයි
IV. ව්‍යාපාරික නීති අනුගමනයයි
V. සාධාරණ මිල ප්‍රතිපත්තියයි

50. නිවැරදි ව්‍යාපාරික සැලැස්මක අන්තර්ගත කරුණක් නොවන්නේ

I. භෞතික සම්පත් සැලැස්ම
II. අලෙවිකරණ සැලැස්ම
III. මානව සම්පත් සැලැස්ම
IV. කළමනාකරණ සැලැස්ම
V. නිෂ්පාදන සැලැස්ම

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020
# General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

ගෘහ ආර්ථික විද්‍යාව II
Home Economics II

28 | S | II

කාලය : පැය තුනයි
Time : Three hours

- **උපදෙස් - පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න**

01.

I. නිර්මාණකරනය සඳහා යොදා ගනු ලබන රේඛා වර්ග දෙකක් නම් කර එයින් ඇතිකරන හැඟීම් වෙන වෙනම දක්වන්න. (ලකුණු 02)

II. අභ්‍යන්තර අවකාශ නිර්මාණයෙදී අවධානය යොමුකල යුතු අංග හතරක් නම් කරන්න. (ලකුණු 02)

III. “ක්‍රියාකාරී ආහාර” යන්න හඳුන්වා ක්‍රියාකාරි ආහාර සඳහා උදාහරණ හතරක් දක්වන්න. (ලකුණු 02)

IV. අධිරුධිර පීඩනය ඇති පුද්ගලයෙකුට ආහාරවේල් සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් දක්වන්න. (ලකුණු 02)

V. “වෙඩි නොවදින නිමාව” පැහැදිලි කරන්න. (ලකුණු 02)

VI. “ගැට පඩු ක්‍රමය” පැහැදිලි කරන්න. (ලකුණු 02)

VII. ගෝලීය වසංගතයක් වූ කොවිඩ් -19 හේතුවෙන් සංචාරක කර්මාන්තය අඩපන විය.මේ තුලින් පරිසරයට ඇති වූ ධනාත්මක හා සෘණාත්මක බලපෑම් දෙක බැගින් දක්වන්න. (ලකුණු 02)

VIII. වේගවත් කරන ලද හරිතාගාර ආවරන නිසා ගෝලීය උණුසුම වැඩිවීමෙන් ඇතිවිය හැකි අහිතකර බලපෑම් දෙකක් දක්වන්න. (ලකුණු 02)

IX. ඵලදායි නොවන සන්නිවේදනයේ අයහපත් ප්‍රතිඵල දෙකක් නම්කර කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

X. දැඩිපාලනය,නිතිරීති, තහංචි පැනවීම, නිදහස සීමා කිරීම තුළින් නව යෞවනයාගෙන් පිළිබිඹු විය හැකි ලක්ෂණ හතරක් දක්වන්න. (ලකුණු 02)

02.

I. සමාජ ජීවන පරිසරය හා භෞතික ජීවන පරිසරය හඳුන්වන්න. (ලකුණු 03)

II. විදුලිය සඳහා ගෙවීමට සිදු වන අමතර මුදල ඉතිරි කර ගත හැකි ක්‍රම 3ක් සඳහන් කරන්න (ලකුණු 03)

III. විකල්ප බලශක්ති ප්‍රභවයක් වන සූර්ය කෝෂ පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 05)

IV. ජලයේ යෝග්‍යතාව බැලීම සඳහා කරන පරීක්ෂණ 3ක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

03

I. තුලිත ආහාර වේලක් සැලසුම් කිරීමේ දී සලකා බැලිය යුතු මූලාශ්‍ර තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

II. ස්ථූලතාවය ඇති වීමට හේතු විය හැකි කරුණු 4ක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

III. ප්‍රෝටීන් ශක්ති මන්දපෝෂණයේ කොටස් දෙක නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

IV. පෙර පාසල් දරුවකුගේ දිවා ආහාර වේල සඳහා බොජුන් පතක් සැලසුම් කරන්න. (ලකුණු 05)

04.

I. කිරි ආහාර පැස්ටරීකරණය කරන ක්‍රම දෙක හඳුන්වා ඉන් එක් ක්‍රමයක් විස්තර කරන්න. (ලකුණු 04)

II. දුම් ගැසීමේ වාසි හා අවාසි පැහැදිලි කරන්න. (ලකුණු 03)

III. ආහාර ආකලන ද්‍රව්‍ය එකතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 03)

IV. (ඒ) ආහාර ඇසුරුම් ලේබලයක තිබිය යුතු අංග 06ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(බී) රික්ත ඇසුරුම්කරණය පැහැදිලි කරන්න. (ලකුණු 03)

05.

I. මේසයකට රෙද්දක් ඇතිරීමේ ප්‍රයෝජන හා මේස රෙද්දක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු 03 බැගින් සඳහන් කරන්න. (ලකුණු 03)

II. ඇඟලුම් කර්මාන්තය ආශ්‍රිතව ආරම්භ කර ඇති විවිධ කර්මාන්ත පිළිබඳ කරුණු හතරක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 04)

III. යෞවනියකට සුදුසු කෙටි සාය මසා ගැනීමේ අනු පිළිවෙල සඳහන් කරන්න. (ලකුණු 04)

IV. ගෘහපිළි සඳහා සකස් කරනු ලබන පිරිසැලසුමක අන්තර්ගත තොරතුරු මොනවාද (ලකුණු 05)

06.

I. හරිතාගාර ආවරණය යනු කුමක් ද? (ලකුණු 04)

II. හරිත පාරිභෝගිකයෙකු වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත් හතරක් ලියන්න. (ලකුණු 04)

III. රාශිගත සංචරනය සහ විකල්ප සංචරනය අතර වෙනස්කම් හතරක් දක්වන්න (ලකුණු 04)

07.

I. හර්ලොක්ට හා ස්වොට්ට අනුව නව යොවුන් විය අනු අවධිවලට බෙදා දක්වන්න. (ලකුණු 03)

II. නව යොවුන් වියේ පසු වන ගැහැණු හා පිරිමි දරුවාගේ කායික හෝ ශාරීරික වර්ධනයේ කැපී පෙනෙන ලක්ෂණ ලිංගික විපර්යාස හා ද්විතියික ලිංගික ලක්ෂණ අනුව පැහැදිලි කරන්න. (ලකුණු 03)

III. ධන ස්වසංකල්පයකින් යුක්ත දරුවෙකු තුළ ප්‍රදර්ශනය වන ලක්ෂණ 05 ක් ඇසුරෙන් විදහා දක්වන්න. . (ලකුණු 05)

IV. පාසලේ විෂය මාලාව, විෂය සමගාමී කටයුතු හා වෙනත් කාර්යයන් වල නිරත වීමෙන් ලබන අත් දැකීම් පසුකාලීනව පෞරුෂය වර්ධනය සඳහා හේතු වේ. කරුණු 05 ක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

08

පහත සඳහන් මාතෘකා අතුරෙන් හතරක් පිළිබඳව සටහනක් ලියන්න.

I. තෙල් මුඩු වීම හා එන්සයිමය දුඹුරු පැහැ ගැන්වීම

II. රෙදිපිළි විරංජනය කිරීම

III. ආහාර වේලකට ධාන්‍ය හා ධාන්‍ය නිශ්පාදන ඇතුලත් කිරීම

IV. සම්පත් අවභාවිතය නිසා ඇති වන අභියෝග

V. බාලාපචාරයට ගොදුරු වීම කෙරෙහි සමාජීය වශයෙන් ඇති බලපෑම